ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணிஆணையாளர்நாயகத்தின்திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
'මිහිකත මැදුර' ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6,රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
1200/6, ரஜமல்வத்தவீதி,பத்தரமுல்ல.
1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனதுஇல / MY NO } 4/1/ප්‍රතිපත්ති (III)
ඔබේ අංකය / உமதுஇல / YOUR NO }
දිනය / திகதி / DATE } 2018.03. 21

වෙබ් ලිපිනය -இணையம் - Web Address - www.lancommdept.gov.lk    ඊමේල් -ஈ-மெயில் - E-mail - landcom@landcommdept.gov.lk

චක්‍රලේඛ අංක - 01/2018

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,

නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන් - අන්තර් පළාත්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## රජය හා රාජ්‍ය ආයතන සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම හා අවිධිමත්ව බැහැර කිරීම වළක්වාලීම

අංක අමප/ 16/1768/738/019 හා 2016.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වළක්වාලීම හා රජයේ ඉඩම් බැහැර කිරීමේ කටයුතු සඳහා විධිමත් පරිපාලන කාර්ය පටිපාටියක් සකස්කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට දන්වන ලදුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යන ආයතනවලින් සැදුම්ලත් කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව අදාළ කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ කාර්ය පටිපාටිය සඳහා අංක අමප/17/2578/012-1 හා 2017.11.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 4-2/1/3/CM 46 හා 2018.01.15 දිනැති ලිපියෙන් ලබා දුන් උපදෙස් පරිදි රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම හා අවිධිමත් ලෙස බැහැර කිරීම වළක්වාලීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම උදෙසා මෙම චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ.



| ඉ.කො.ජ. කාර්යාලය (පොදු) கா.ஆ.நா.பொது General | පාලන நிர்வாகம் Administration | ගිණුම් கணக்கு Accounts | ඉඩම් I காணி I Land I | ඉඩම් II காணி II Land II | ඉඩම් III காணி III Land III |
|---|---|---|---|---|---|
| දුරකථන - 0112797400 | දුරකථන - 0112797479 | දුරකථන - 0112875833 | දුරකථන - 0112874025 | දුරකථන - 0112875834 | දුරකථන - 01127 |
| ෆැක්ස්- 0112864051 | ෆැක්ස්- 0112873033 | ෆැක්ස්- 0112864462 | ෆැක්ස්- 0112883812 | ෆැක්ස්- 0112873110 | ෆැක්ස්- 0112883 |

1. රජය, රාජ්‍ය ආයතන හා රජයේ අනුබද්ධිත ආයතන සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් වැළැක්වීම.

1.1 සියළු රාජ්‍ය ආයතන හා රජයේ අනුබද්ධිත ආයතන වෙත පවරා ඇති සහ මේ දක්වා භුක්ති විඳිමින් සංවර්ධනය කර ඇති එක් එක් ආයතන විසින් රජයේ ඉඩම් පිළිබඳව තොරතුරු ඇතුලත් විධිමත් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. එම කාර්යයෙහි සමස්ත වගකීම ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත පැවරේ.

1.1.1 රජය, රාජ්‍ය ආයතන හා රාජ්‍ය අනුබද්ධිත ආයතන වෙත කළමනාකරණය සඳහා විධිමත් ලේඛනයක් මඟින් බැහැර කර ඇති සියලුම ඉඩම් පිළිබඳ ලේඛනයක් සහ මේ වන විට භුක්ති විඳිමින් සංවර්ධනය කර ඇති ඉඩම් පිළිබඳ ලේඛනයක් අදාළ ආයතන විසින් නඩත්තු කළ යුතු අතර එම ලේඛනයන්හි පිටපත් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලබාදිය යුතුය. එමෙන්ම මේ දක්වා විධිමත් අයිතියක් ලබා නොගත් ඉඩම් විධිමත් අයිතිය ලබා ගැනීමට කටයුතු සූදානම් කරගත යුතු අතර උක්ත කාර්යයන් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී ඇති රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියද භාවිතා කළ හැක. එම කාර්යයේ සමස්ත වගකීම ඉඩම් කොමසාරිස් ජනරාල් සතුවේ.

1.1.2 එක් එක් ආයතන යටතේ පවත්නා ඉඩම්වලට අනවසර ඇතුළුවීම් වැළැක්වීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අදාළ ආයතනයේ පූර්ණ වගකීම වන අතර එම ඉඩම්වල මායිම් පහසුවෙන් හඳුනා ගැනීම සඳහා අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් මඟින් ග්‍රාම නිලධාරීගේ සහයෝගයෙන් සුදුසු වැඩ පිළිවෙලක් යෙදිය යුතුය.

1.2 අනවසරයෙන් අල්ලා ගැනීම් වැළැක්වීම සහ හා විධිමත් අවසරයකින් තොරව දැනටමත් භුක්ති විඳින රජය හා රාජ්‍ය අනුබද්ධිත ආයතනවල ඉඩම් සම්බන්ධව පහත පරිදි කටයුතු කළ යුතුය.

1.2.1 විවිධ සංවර්ධන හා වෙනත් අවශ්‍යතා සඳහා රජය හා රාජ්‍ය අනුබද්ධිත ආයතන වෙත පවරා දී ඇති ඉඩම් ඵලදායීව යොදා ගැනීම හා එම ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීම අදාළ ආයතනවල වගකීම වේ. ඉහත 1.1.2 යටතේ හඳුනාගත් සියළු ඉඩම් අනවසර අල්ලා ගැනීම වැළැක්වීම සඳහා ග්‍රාම නිලධාරිවරුන් විසින් කඩිනමින් කටයුතු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ද සහාය ලබාගත යුතුය. ග්‍රාම නිලධාරිවරුන් විසින් තම කොට්ඨාශය තුළ රජයේ ඉඩම් අනවසර අල්ලා ගැනීම් පිළිබඳව පූර්ණ වාර්තාවක් සති දෙකකට වරක් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. අනවසර අල්ලා ගැනීම් නොමැති වන අවස්ථාවකදී ශුන්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීමට වග බලාගත යුතුය.

3. විධිමත් අවසරයකින් තොරව භුක්ති විඳින ඉඩම් සම්බන්ධව කරණු ලබන ඉල්ලීම් පිළිබඳව සලකා බැලීම.

විධිමත් අවසරයකින් තොරව රජයේ ඉඩම් අඛණ්ඩව භුක්ති විඳිමින් සිටින පුද්ගලයින් විසින් එම ඉඩම් ඔවුන් වෙත ඉල්ලා සිටින අවස්ථාවන්හි දී එම ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම අදාළ ඉඩම් කළමනාකරණය කිරීමේ වගකීම පැවරී ඇති ආයතනය සතු වගකීමකි. එබඳු පුද්ගලයින් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන බවට අදාළ ආයතනය තීරණය කරන්නේ නම් පමණක් එම විශේෂ අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩලය විසින් අන් ආකාරයකින් දක්වා ඇති අවස්ථාවකදී හැර අන් සෑම අවස්ථාවකදීම පහත පරිදි කටයුතු කළ යුතුය.

3.1 විධිමත් අවසරයකින් තොරව රජයේ ඉඩම් භුක්ති විඳින්නන්ගේ ඉල්ලීම් සම්බන්ධව පවත්නා ක්‍රමවේදයට අනුව කටයුතු කිරීමට සළකා බැලීම.

3.1.1 විධිමත් අවසරයකින් තොරව රජයේ ඉඩම් භුක්ති විඳින්නන් **නේවාසික** කටයුතු සඳහා භාවිතා කරන ඉඩම්වලින් පුද්ගලයන් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවලදී පවතින විධිමත් ක්‍රමවේදය අනුගමනය කරමින් අදාළ ඉඩම පිහිටි පළාත් පාලන බලප්‍රදේශය තුල නේවාසික කාර්යයන් සඳහා අවශ්‍ය යැයි තීරණය කර ඇති අවම සීමාවට යටත්ව ඉඩම් කොටසක් අදාළ ඉල්ලුම්කරු වෙත ලබාදීමට සලකා බැලීම.

3.1.2 අනවසරයෙන් අල්ලාගෙන **වාණිජ** කටයුතු සඳහා යොදා ගෙන ඇති රජයේ ඉඩම්වලින් පුද්ගලයන් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවලදී අදාළ ඉඩමේ කරන ලද සංවර්ධන වටිනාකම් පදනම් කරගෙන එක් අක්කරයක අවම වශයෙන් **රුපියල් මිලියන 04 කට නොඅඩු සංවර්ධනයක් සිදු කරන ලද ඉඩම් පමණක් එසේ සංවර්ධනය** කළ අවිධිමත් භුක්ති විඳින්නන් වෙත ඉඩම අයත් ආයතනයට අදාළ අණපනත් හා විධිවිධාන යටතේ ලබා දීම සළකා බැලීම.

3.1.3 **වෙළඳපල අරමුණු කරගෙන ක්‍රියාත්මක කරන කෘෂිකාර්මික** වගාවන් හා ව්‍යාපෘති සඳහා යොදා ගෙන ඇති රජයේ ඉඩම්වලින් පුද්ගලයන් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවලදී අදාළ ඉඩමේ කරන ලද සංවර්ධන වටිනාකම් පදනම් කරගෙන එක් අක්කරයක අවම වශයෙන් **රුපියල් මිලියන 04** කට නොඅඩු සංවර්ධනයක් සිදු කරන ලද ඉඩම් පමණක් එසේ සංවර්ධනය කළ අවිධිමත් භුක්ති විඳින්නන් වෙත ඉඩම අයිති ආයතනයට අදාළ අණපනත් හා විධිවිධාන යටතේ ලබා දීම සළකා බැලීම.

3.1.4 වෙළඳපොල අරමුණු කර නොගෙන ක්‍රියාත්මක කරනු ලබන අක්කරයකට රුපියල් මිලියන 4 කට වඩා අඩු සංවර්ධන වටිනාකමක් සහිත කෘෂිකාර්මික වගාවන් සඳහා යොදවා ගෙන ඇති ඉඩම විධිමත් අවසරයෙන් තොරව රජයේ ඉඩම් භුක්ති විඳින්නන් විසින් සිදු කර ඇති සංවර්ධනය සලකා බලා එම පුද්ගලයන් ඉඩම්වලින් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන බව පෙනී යන්නේ නම්, අක්කර තුනක උපරිමයට යටත්ව අනවසරකරුවන් වෙත අදාළ ඉඩම අයත් ආයතනයේ අණපනත් විධිවිධාන යටතේ ලබා දීමට සළකා බැලීම.

1.2.2 අනවසර අල්ලා ගැනීම සම්බන්ධයෙන් 1983 අංක 58 (සංශෝධන) පනත හා 1983 අංක 29 (සංශෝධන) පනත් වලින් සංශෝධිත 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත යටතේ කඩිනමින් ක්‍රියාමාර්ග ආරම්භ කිරීම අදාළ බලධාරීන්ගේ වගකීම වේ. එසේ සන්තකය ආපසු ලබාගන්නා ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම අදාළ ආයතන මඟින් සිදු කළ යුතුය. රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගත් පුද්ගලයින්ට එම අනවසර ඉඩම් සඳහා ඇතැම් අවස්ථාවල මූලික මානුෂීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන ජලය, විදුලිය වැනි මූලික අවශ්‍යතා සපයා දී ඇතත් කිසිදු අවස්ථාවක එම සේවා සැපයීම් හා එයට අදාළ ලේඛන ඉඩම් හිමිකම ලබා ගැනීමට හිමිකමක් නොවේ.

1.2.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදුවන අනවසර අල්ලා ගැනීම් හා ඒ සම්බන්ධයෙන් අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග පිළිබඳව රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන අනෙකුත් ආයතනයන්ගෙන් ද ලබාගත් තොරතුරු ඇතුළත් සමස්ත මාසික වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාසික සාකච්ඡාවට යොමු කළ යුතුය. එහි සමාලෝචනය පිළිබඳ වාර්තාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.

1.2.4 අනවසර අල්ලා ගැනීම සම්බන්ධයෙන් නෛතික හා අනෙකුත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී එනම්, පිස්කල් ගාස්තු ඇතුළුව ඒ සම්බන්ධයෙන් වැයවන අනෙකුත් වියදම් ඉඩම් බලධාරියා ලෙස ප්‍රාදේශිය ලේකම්වරයා කටයුතු කරන අවස්ථාවන්හි දී ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාදීම ඉඩම් කොමසාරිස් ජනරාල් මඟින් සිදු කෙරේ.

## 2. රජය හා රාජ්‍ය ආයතන සතු ඉඩම් ආරක්ෂා කර ගැනීම සඳහා පොදු ප්‍රතිපාදන

2.1 රක්ෂිත ඉඩම් ආරක්ෂා කර ගැනීම අදාළ බලධාරීන්ගේ වගකීම වේ. රක්ෂිත ඉඩම් සම්බන්ධ කටයුතු රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 231 යටතේ අදාළ බලධාරීන් විසින් කටයුතු කළ යුතුය.

2.2 දැනටමත් අනවසරකරුවන්ගේ ග්‍රහණයට ලක්ව පරිසර විනාශයට සහ ස්වභාවික ආපදා තත්වයන්ට හේතුවන සේ පරිහරණය කරණු ලබන බවට හඳුනාගෙන ඇති රජයේ ඉඩම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීමට කටයුතු කළ යුතුය.

2.3 අනවසර අල්ලාගැනීම් තවදුරටත් අධෛර්යමත් කිරීම සඳහා අනවසරයෙන් පරිහරණය කරන අවස්ථාවන්හි දී එම ඉඩම් සඳහා විදුලිය, ජලය වැනි මූලික පහසුකම් ඉල්ලා සිටින අවස්ථාවන්හිදී අදාළ ඉඩම් පරිහරණය තුළ සිදුවන ස්වාභාවික හා පරිසර හානි යනාදි සාධක පිළිබඳ අදාළ ආයතන දැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

3.2 ඉහත 3.1 අවස්ථාවන්ට අයත් නොවන

3.2.1 අනවසරයෙන් අල්ලාගෙන වාණිජ කටයුතු සඳහා සහ වෙළඳපල අරමුණු කර ගෙන ක්‍රියාත්මක කරන කෘෂිකාර්මික වගාවන් හා ව්‍යාපෘති සඳහා යොදාගෙන ඇති ඉඩම්වල සංවර්ධන වටිනාකම රුපියල් මිලියන 04කට අඩුවන අවස්ථා

3.2.2 වෙළඳපළ අරමුණු කර නොගත් කෘෂිකාර්මික වගාවන් සහිත ඉඩම්වල සිදුකර ඇති සංවර්ධන වටිනාකම අක්කරයට රුපියල් මිලියන 04කට වඩා අඩුවන හා ඉඩමේ වපසරිය අක්කර තුනකට වඩා වැඩි වන අවස්ථා

යන අවස්ථාවන්හි දී පහත සඳහන් කමිටුවේ නිර්දේශ මත පමණක් කටයුතු සිදුවිය යුතුය.

01. සභාපති - ඉඩම් කොමසාරිස් ජනරාල්
02. සාමාජික - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු
03. සාමාජික - අදාළ පළාත් ප්‍රධාන ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු
04. සාමාජික - මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරියෙකු
05. ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ආයෝජනයට අදාළ විෂය ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවයන් සහිත රාජ්‍ය ආයතනයන්හි නියෝජනයක්

3.2.3 ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පරිපාලනයෙන් බැහැර වන ඉඩම් සම්බන්ධව එම කමිටුවේ සභාපති එම අදාළ ආයතනයේ ප්‍රධානියා වේ.

3.2.4 ඉහත කී කමිටුව මඟින් අදාළ ඉල්ලීම් ඇගයීමේ දී දැනට පවතින නෛතික හා අනෙකුත් රෙගුලාසි මෙන්ම අදාළ ව්‍යාපෘතියේ හා ආයෝජනයේ ස්වභාවය, එමඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ඇතුළු අනෙකුත් සාධනීය කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම සුදුසු වේ.

3.2.5 කමිටුවට ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් කමිටුව සෑහීමකට පත්නොවන අවස්ථාවන්හි දී විවෘත ක්‍රමවේදයක් මඟින් අයදුම්පත් කැඳවා අදාළ ඉඩම බැහැර කිරීමට නිර්දේශ ඉදිරිපත් කළ හැක. එහිදී කමිටුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ අයදුම්කරුවන්ට ද අයදුම් කළ හැක.

**3.3 ඉහත 3.1 හා 3.2 ප්‍රතිපාදන යටතේ දැනටමත් රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින්නන් හට එම ඉඩම් ලබා ගැනීමට සුදුසුකම් ලබන්නේ නම් ,**

3.3.1 විධිමත් අවසරයකින් තොරව රජයේ ඉඩම් භුක්ති විඳින අයෙකු එම ඉඩම ලබා ගැනීමට සුදුසුකම් ලබන්නේ නම් එම අනුමැතිය ලබා දෙන ලද දිනය පදනම් කොටගෙන එදින සිට රජයට අය විය යුතු මුළු බදු මුදල් හා වාර මුදලක් අදාළ වන පරිදි අයකර ගත යුතුය.

3.3.2 පනතේ ප්‍රතිපාදනවලට අමතරව අනවසරකරුවන් වෙතින් එසේ දීර්ඝ කාලීන බදු ලබා දීමට තීරණය කරන වර්ෂය පදනම් කරගෙන දේපලේ නොදියුණු වාණිජ වටිනාකමින් එකවර අය කර ගනු ලබන 10% ක දඩ මුදලක් අය කර ගත යුතුය.

මෙම චක්‍රලේඛය අනුව සුදුසුකම් ලබන්නන් අනෙකුත් චක්‍රලේඛ හා අමාත්‍ය මණ්ඩල තීරණවල අඩංගු සහන හිමි නොවේ.

4. රජය සතු ඉඩම් බැහැර කිරීමේ ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

4.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගනු ලබන රජයේ ඉඩම් නේවාසික, කෘෂිකාර්මික හා වාණිජ කටයුතු සඳහා මහජනතාව වෙත බැහැර කිරීමේ දී දැනට පවතින ඉඩම් කච්චේරි/ ටෙන්ඩර්/ ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කිරීමෙන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පවත්වා ගෙන යා යුතුය.

4.2 රාජ්‍ය ආයතනයක් සතු ඉඩමක් යම් සුවිශේෂී සංවර්ධන කටයුතු සඳහා අනුග්‍රාහික පදනමින් බදු ලබා දීමේදී අංක අමප/17/1241/701/016 හා 2017.06.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ ප්‍රතිපාදනයන්ට යටත්ව කටයුතු කළ යුතුය.
ඒ අනුව එවැනි අවස්ථාවකදී ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2017/01 හා 2017.07.04 දිනැති 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු පදනම මත බැහැර කර ඇති වාණිජ ඉඩම් සඳහා බදු සහන ලබාදීම මැයෙන් වන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ කරගත යුතුය.

4.3 රජය හා රාජ්‍ය ආයතන වෙත බැහැර කර ඇති ඉඩම් ප්‍රස්තුත කාර්යයට පමණක් යොදාගත යුතුය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලිඛිත අනුමැතිය කලින් ලබාගෙන මිස අන් කිසිදු කාර්යයක් සඳහා එය භාවිතා නොකළ යුතුය.

5. **උක්ත සියළු විධි විධාන යටතේ සිදු කරන බැහැර කිරීම් අක්කර 50 ට වැඩි ඉඩම් බැහැර කිරීමේ දී ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්/චක්‍රලේඛ හා නියෝග හා 2016 මැයි මස 02 දිනැති චක්‍රලේඛය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීම අනිවාර්යය වේ.**

මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන 2017.11.21 දින සිට ක්‍රියාත්මක කිරීමට අදාළ නිලධාරීන් විසින් වග බලාගත යුතුය.

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
3. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
4. වන සංරක්ෂක ජනරාල්, වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
5. මහවැලි අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
6. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව